# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013**
**(නව නිර්දේශය)**
**2016 අගෝස්තු - ඔක්තෝබර්**

**සමාජීයවිද්‍යා පීඨය**

**සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය - TCRM - E 3025**

**සංස්කෘතික සම්පත් කළමනාකරණය**

**ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i. සංස්කෘතික සම්පත් යනු මොනවාද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

    ii. සංචාරක ව්‍යාපාරය කෙරෙහි සංස්කෘතික සම්පත් වැදගත් වන්නේ කෙසේ දැයි විග්‍රහ කරන්න. (ලකුණු 10)

02. සංස්කෘතික සම්පත් කළමනාකරණය විෂය පථය නිර්මාණයවීමේ පසුබිම පැහැදිලි කරන්න (ලකුණු 10)

03. i. ලෝක උරුම සංකල්පය ඇතිවීමේ පසුබිම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

    ii. රටක ඇති සංස්කෘතික හා **ස්වාභාවික** උරුමයන් ,ලෝක උරුම බවට පත් කිරීමට යෝජනා කිරීමේ ක්‍රියා පටිපාටිය සැකවින් විස්තර කරන්න. (ලකුණු 15)

04. ලෝක උරුම නගරයක් ලෙස අනුරාධපුර පූජනීය නගරය තුළ ඇති විභවතා විස්තර කර ඒවා සංචාරක ව්‍යාපාරයට යොදා ගත හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. i. පුරාවිද්‍යාත්මක හානි ඇගයුමක් යනු කුමක් ද? (ලකුණු 05)

    ii. පුරාවිද්‍යාත්මක හානි ඇගයුමක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටිය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 15)

06. සංචාරක කර්මාන්තය හේතුවෙන් සංස්කෘතික සම්පත්වලට සිදුවන අයහපත් බලපෑම උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 20)

07. සංස්කෘතික දේපල රැකගැනීම සඳහා ශ්‍රී ලාකාවේ ඇති අනපනත් හා නීතිවලින් ලැබෙන දායකත්වය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න. (02 x 10 ලකුණු 20)

    i. සීගිරිය ලෝක උරුමය අශ්‍රිත ගැටලු
    ii. ස්පර්ශිත සංස්කෘතික උරුමය
    iii. මධ්‍යම සංස්කෘතික අරමුදල
    iv. ජීවමාන ලෝක උරුම නගරයක් ලෙසට මහනුවර ඇති වැදගත්කම

**********************